පැලියගොඩ නගර සභාව

----------------------

ගම්පහ දිස්ත්‍රික්කය

----------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල වරිපනම් සඳහා ලැබී තිබූ රු:408,848 වටිනා චෙක්පත් 04 ක් අගරු වී තිබූ අතර එම වටිනාකම අගරු චෙක්පත් ගිණුමට හර කර නොතිබියදී එම චෙක්පත් සඳහා මුදල් ලැබීම අගරු චෙක්පත් ගිණුම බැර කිරීම නිසා අගරු චෙක්පත් ගිණුම වැඩියෙන් පෙන්වා තිබුණි. | චෙක්පතක් අගරුවීමේදී ණයගැතියන්ට හරකල යුතුවේ. | 2019 ගිණුම තුළින් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී ගෙවිය යුතු ලෙස හඳුනා ගෙන තිබූ රු.377,382 ක් වෙනුවෙන් ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | අනාගතයේදී ගෙවීමට සිදුවන වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කළ යුතුවේ. | සිදුව ඇති අතපසු වීමක් හේතුවෙන් මෙම වරද සිදු වී ඇත. නැවත සිදු නොවීමට කටයුතු කරමි. |
| (iii) | තොග වටිනාකම ලෙස රු.821,911ක් වූ භෞතික තොගය ගිණුම් ගත කිරීම වෙනුවට රු:16,465,890 ක ලෙජර ශේෂය ගිණුම් ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල භෞතික තොගය සටහන් කළ යුතුවේ. | පැරණි ශේෂයක් වන ලෙජර ශේෂය දිගින් දිගටම පැවත එන්නක් වන අතර සමුච්චිත අරමුදලට ගලපා නිවැරදි කිරීමට 2019 වර්ෂයේදී කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 04 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අතර රු.16,044,075 ක වෙනසක් විය. | අදාල ශේෂ වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවක ණය හා ගබඩා තොග ශේෂ වෙනස්කම් තොරතුරු නොමැති වීමෙන් නිවැරදි කිරීමට නොහැකි අතර අනෙකුත් ශේෂ වෙනස්කම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂ ගණනාවක සිට හඳුනාගත නොහැකිව පැවත එන රු.192,716 ක අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලාවරෝධයට යටත් නොවී අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවත එන රු.11,223,488 ක් වටිනා ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරින් විසින් අදාල පොත්පත් හා ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | ණය හිමි ලේඛණය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මෙම වරද සිදුව ඇත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු. 98,920,198 ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාලව තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී පිළියෙල කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| බස්නාහිර පලාත් සභාවේ 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තියේ 2(අ) වගන්තිය | පොදු කාණු තුළට අප ජලය මුදාහැර තිබූ හෝටල්/ව්‍යාපාර 16 ක් හා නිවාස 37 ක් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හඳුනාගෙන තිබූ අතර ඒවා නිවැරදි කිරීම් කරන ලෙස අදාල හෝටල්, ව්‍යාපාර හිමිකරුවන්ට 2018 මැයි මස ලිපි මගින් දැනුවත් කර තිබුණද මේ පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. | පසු විපරම් කටයුතු කළ යුතු වේ. | නීත්‍යානුකූල කටයුතු කඩිනමින් සිදු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත උපදෙස් ලබා දී ඇත. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ග්‍රාම නිලධාරි තහවුරුවකින් තොරව බදු සහන හා දේපල වසා තැබීම් මත සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායමින් රු.209,919 ක් කපා හැර තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුවේ. | බදු සහන මත රු.204,948 ක්ද දේපල වසා තැබීම් මත රු.4,971 ක් කපාහැර ඇත්තේ පුද්ගල ඉල්ලීම් මතවේ. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු:22,875,793 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු:12,932,516 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 42,000 | 41,524 | 36,467 | 26,918 | 40,500 | 41,450 | 42,792 | 26,754 |
| (ii) | කුලී | 4,071 | 4,564 | 3,420 | 997 | 3,499 | 3,229 | 3,264 | 103 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,306 | 2,471 | 2,480 | 6 | 2,127 | 1,990 | 1,990 | - |
| (iv) | වෙනත් ආදායම් | 18,068 | 31,417 | 31,417 | 343 | 19,480 | 6,353 | 6,353 | - |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුකර තිබූ වෙනත් ආදායම් රු.18,068,000 ක් වුවද රු.31,417,000 ක් රැස්කර තිබූ හෙයින් ඇස්තමේන්තු කිරීම තාත්වික ආකාරයෙන් සිදුකර නොතිබුණි. | ඇස්තමේන්තු පිළියෙල කිරීම තාත්වික ආකාරයෙන් සිදු කළ යුතුය | පිළිතුරු ලැබී නැත. |

2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.26,922,350 ක් වූ හිඟ වරිපනම් වටිනාකමින් රු.50,000 ඉක්මවා තිබූ වරිපනම් ඒකක 17 ක් වෙනුවෙන් 2019 මැයි 31 දිනට අයවිය යුතු වටිනාකම රු.2,703,788 ක් වී තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසිය යුතුවේ. | හිඟ වටිනාකමින් රු.2,497,416 ක් මේ වන විට අයකර ගෙන ඇත. ඉතිරිය අයකර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ඇත. |

2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද කුලී ආදායමට වඩා රු.1,144,000 ක් අඩුවෙන් රැස් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ආදායම වර්ෂය තුළම ලබා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | 2017 වර්ෂයේදී කුලී ආදායම් ලෙස සියලුම ආදායම් බිල්කිරීම් කර ඇති අතර 2018 වර්ෂයේදී හිඟ ආදායම් පමණක් බිල්කර ඇත. ඒ හේතුවෙන් 2017 ට වඩා 2018 වර්ෂයේ ආදායම් අඩු වී ඇත. |
| (ආ) | පොදු වෙළඳපලේ කඩ කාමර 02 කින් හා තැපැල් කාර්යාලයෙන් කිසිදු ගාස්තුවක් අයකරගෙන නොතිබුණු අතර කඩ කාමර 14 කින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු කුලී වටිනාකමින් සියයට 50 ඉක්මවූ රු.488,710 ක් 2019 මැයි 23 වන විටත් අය කරගෙන නොතිබුණි. | රජයේ තක්සේරුව අනුව කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර සඳහා සියයට 100 ක තක්සේරු වටිනාකම සභා තීරණයක් අනුව සියයට 50 දක්වා අඩුකර අයකර තිබුණි. එම වටිනාකම අයකර ඇත. |
| (ඇ) | නගර සභාව සතු දේපලවල අයිතිය ඔප්පු මගින් තහවුරු කර නොගැනීම හේතුවෙන් පෙර වර්ෂයේදී බදුදී ආදායම් උපයා තිබූ සභාව සතු දේපල අයිතම 10 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ආදායමක් උපයා ගැනීමට නොහැකිව පැවතුණි. | සභාව සතු දේපලවල නිත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නගර සභාව සතු දේපල වල අයිතිය ඔප්පු සකස් කර තහවුරු කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. ඉදිරියේදී අයිතිය තහවුරු කරගෙන බදු දීමට කටයුතු කරමි. |

2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි ව්‍යාපාර හා කර්මාන්ත 06 කින් සමාලෝචිත වර්ෂය තුල පරිසර බලපත්‍ර අය කර නොතිබුණි. | ව්‍යාපාර හා කර්මාන්තවලින් බලපත්‍ර ගාස්තු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර 02 ක් සඳහා නිර්දේශ කර ඇති අතර ව්‍යාපාර 4 ක් සඳහා අඩුපාඩු සම්පූර්ණ කරන තුරු නිර්දේශ නොකරන ලදී. |

2.2.6 වෙනත් ආදායම්

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කුළුණු ආදායම් | | |
| සන්නිවේදන කුළුණු 09 ක් සඳහා රු.94,927 ක වරිපනම් ගාස්තුවක් 2019 මැයි 23 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. | අදාල ගාස්තු අයකල යුතුවේ. | ලිපි මඟින් දැනුම් දී ඇති අතර ඉදිරියේ දී සියළුම මුදල් අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) කසළ බදු ආදායම | | |
| සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත හා ව්‍යාපාර ආයතන 187 කින් කසළ බැහැර කිරීමේ ගාස්තු අයකර ගෙන නොතිබුණි. | අදාල ගාස්තු අය කළ යුතුවේ. | කසල ආදායම් අයකිරීම 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. |

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්ය සාධනය

----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) නිම කර නොතිබූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ රු.152,461 ක් වූ ව්‍යාපෘතියක් 2018 මැයි 22 දින වන විටත් ඉටු කර නොතිබූ අතර කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ගිවිසුම්ගතව තිබූ රු.493,489 ක් වූ ව්‍යාපෘති 02 ක් එදින වන විටත් නිම කර නොතිබුණි. | ප්‍රදේශයට අත්‍යාවශ්‍ය හා වැදගත්ම ව්‍යාපෘති තෝරා ගෙන සැලසුමට අනුව නියමිත කාලවකවානුවල නිම කළ යුතුවේ. | ඇස්තමේන්තු සකසා තිබූ රු.152,460 ක් වූ ව්‍යාපෘතිය ඉටු නොකර ප්‍රදේශයේ වෙනත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් සඳහා මාරු කරන ලදී. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන එම අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම හා එහි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර එම අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු අන්තර්ග්‍රහණය කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතී. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.552,083 ක ණය ශේෂයක්ද, සේවය හැර ගිය, සේවයෙන් ඉවත් කල හා මියගිය නිලධාරින් 40 දෙනෙකුගෙන් අයවිය යුතු රු.804,800 ක ණය ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය | නිලධාරින් 30 දෙනෙකුගේ රු.330,055 ක ණය ශේෂයක් කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. විශ්‍රාම ගිය නිලධාරින් 06 දෙනෙකුගේ රු.705,532 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර දෙදනකුගේ ණය ශේෂ අය කර ඇත. |

3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2003 හා 2007 වර්ෂවලදී කැලණිය ධර්මාලෝක මාවතේ නාරම්මිණිය කුඹුරු ලොට් 1 හා 2 අයිතිකරුගේ ඉඩමට යාබඳව තිබූ ඇළ පළල් කිරීම නිසා පර්චස් 135 ක් අහිමි වූ බව සඳහන් කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් පවරා තිබූ අතර එහිදී නිශ්චිත වන්දි මුදලක් සඳහන් කිරීමකින් තොරව ගෙවීම් නිර්දේශයක් කර තිබුණි. අයිතිකරු විසින් එම නිර්දේශය පරිදි රුපියල් ලක්ෂ 82.5 ක වන්දියක් සභාවෙන් ගෙවන ලෙස ඉල්ලීමක් කර තිබුණි.මේ පිළිබඳ ගිණුම් මඟින්ද හෙළිදරව් කර නොතිබුණි. | ව්‍යාපෘති කිරීමේදී පෞද්ගලික දේපළවලට හානි නොවන පරිදි කටයුතු කළ යුතුවේ. | රු:8,250,000 ක මුදල පැමිණිලිකරුගේ තක්සේරුකරුවකු විසින් තීරණය කරන ලද මුදලක් වන අතර රජයේ තක්සේරුවක් ලබාගැනීමටත් අභියාචනයක් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමටත් ඊට අමතරව 2019 අයවැය යෝජනාවෙන් ලක්ෂ 50 ක මුදලක් වෙන් කිරීමටත් තීරණය කර ඇත. |

3.4 ප්‍රසම්පාදනය

සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා ගර්භය ඇතුලු කාර්යාලය නවීකරණය සඳහා කාර්යාල ගෘහ භාණ්ඩ සපයා ගැනීමට මිල ගණන් කැඳවීමේදි පිරිවිතරයේ අවශ්‍ය දැව වර්ගය හා නිමාව (කැටයම් සහිත බව) සඳහන් කර නොතිබීම හේතුවෙන් එය පසුව තීරණය කිරීම නිසා එම භාණ්ඩ රු.212,250 කින් මුල් වටිනාකමට වඩා වැඩිවී තිබූ අතර එම කාර්යාල ගෘහ භාණ්ඩවල සුව පහසුව පිළිබඳව සාලකිලිමත්වී නොතිබුණි. | අවශ්‍යතාවයට අනුව පිරිවිතර පිළියෙල කළ යුතුවේ. | ආයතනවල නියෝජිතයින් නිරීක්ෂණය කර දෙන ලද උපදෙස් අනුව එම ආයතන වලින් ලැබුන ගැලපෙන නව සැලසුම් අනුව සුදුසු වර්ගයේ දැව තෝරා ගන්නා ලදී. සභා ගර්භයේ භෞතික තත්ත්වය පිළිබඳ සැලකිල්ලට ගෙන ඊට සුදුසු දැව වර්ගය තේක්ක බවට වැඩ අධිකාරී හා තාක්ෂණ නිලධාරී තීරණය කර ඇත. |